රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 46/90(I)

මගේ අංකය :- 1/543ඊ/552ඩී/V-ඒ
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොලඹ 07.
1994 ජූනි මස 20 වන දින.

සියලුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## බඳවා ගැනීමේ පරිපාටි වලට ඇතුලත් කළ යුතු
## <u>වෙනත් අධ්‍යාපනික සුදුසුකම්</u>

ඔබගේ අවධානය 1977.03.09 දින අංක. 234 දරණ ආයතන චක්‍රලේඛ ලිපියට, 1987.09.25 දින අංක.379 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට හා 1990.10.30 දින අංක.46/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට යොමු කරනු ලැබේ.

02. පහත දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම් ද අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල දක්වා ඇති සුදුසුකම් වලට විකල්ප අධ්‍යාපනික සුදුසුකම් වශයෙන් පිළිගත යුතු යයි තීරණය කර ඇත.

| නව අධ්‍යාපනික සුදුසුකම් | | එම සුදුසුකම් වලට සමාන කළ හැකි වෙනත් අධ්‍යාපනික සුදුසුකම් | | වැඩි විස්තර සඳහා විමසීම් |
|---|---|---|---|---|
| 1) | කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයෙන් නිකුත් ලද කෘෂිකර්ම ඩිප්ලෝමාව | 1. | පැල්වෙහෙර කෘෂිකර්ම විද්‍යාලයෙන් නිකුත් කරන ලද කෘෂිකර්ම ඩිප්ලෝමාව | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය කෘෂි/33/1 |
| | | 2. | අඟුණකොලපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලයෙන් නිකුත් කරන ලද කෘෂිකර්ම ඩිප්ලෝමාව. | |
| | | 3. | පේරාදෙනිය කෘෂිකර්ම විද්‍යාලයෙන් නිකුත් කරන ලද කෘෂිකර්ම ඩිප්ලෝමාව. | |
| | | 4. | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යන වැලිසර සත්ව පාලන විද්‍යාලයෙන් නිකුත් කරන ලද සත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමාව. | |

| | | | |
|---|---|---|---|
| | | 2. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යන සිප්පුකුලමේ සත්ව පාලන විද්‍යාලයෙන් නිකුත් කරන ලද සත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමාව. | |
| | | 3. හාඩි ආයතනය විසින් නිකුත් කරන ලද කෘෂිකර්ම ඩිප්ලෝමාව | |
| | | 4. ඇක්වයිනාස් විශ්ව විද්‍යාල ආයතනය විසින් නිකුත් කරන ලද කෘෂිකර්ම ඩිප්ලෝමාව | |
| II). | පිළිගත් විශ්ව විද්‍යාලයකින් පිරි නමනු ලැබ ඇති සැපයීම් හා ද්‍රව්‍ය කළමණාකරණ ක්ෂෙත්‍රයට අදාල පළමුවෙනි පන්තියේ හෝ දෙවෙන පන්තියේ ගෞරව උපාධියක්. | ශ්‍රී ලංකා සැපයීම් හා ද්‍රව්‍ය කළමණාකාරිත්ව ආයතනයේ සාමූහික සාමාජිකත්වය සමඟ පිළිගත් ආයතනයක විධායක තත්ත්වයේ තුන් අවුරුද්දක පළපුරුද්ද | |
| III). | ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සංගමයේ අවසාන(පණ්ඩිත) උපාධිය | පිළිගත් විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රවේදී (බී.ඒ.) උපාධිය | ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ‘ඉසුරුපාය. බත්තරමුල්ල. |

**03.** අදාල බඳවා ගැනීමේ පරිපාටි පරීක්ෂා කර බලා මෙම නව අධ්‍යාපනික සුදුසුකම් යෝග්‍ය අවස්ථාවන්හිදී එම පරිපාටිවලට ඇතුලත් කිරීමට කටයුතු කළ මැනවි.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.